ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
සමාජ අධ්‍යයන අංශය
තරුණ කටයුතු පිළිබඳ උසස් ඩිප්ලෝමාව - 04 වන මට්ටම
අවසාන පරීක්ෂණය - දෙවන අර්ධ වර්ෂය 2024/2025
**DSD4501- ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම**

කාලය: පැය 02යි.

---

දිනය: **16/08/2025** වේලාව: පෙ.ව. 9 . 30 - පෙ.ව. 11. 30

---

උපදෙස්

- ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු විසි පහක් (25) හිමි වේ.
- පැහැදිළි අත් අකුරු අපේක්ෂා කෙරේ.

01. i. "ප්‍රතිපත්ති" (Policy) යන පදය නිර්වචනය කරන්න. (ල.5)

ii. ශ්‍රී ලංකාවේ ප්‍රජා මට්ටමේ ඕනෑම සංවිධාන පහක් විසින් හඳුන්වා දී ඇති ප්‍රතිපත්ති පහක් ලයිස්තුගත කරන්න. (ල.10)

iii. ප්‍රශ්නය (ii)හි ලැයිස්තුගත කළ ප්‍රතිපත්ති පහට අදාළව, ඒවා ශ්‍රී ලංකාවේ තරුණයින්ට කළ බලපෑම සාකච්ඡා කරන්න. (ල.10)

02 i. ජාතික තරුණ ප්‍රතිපත්තියේ මූලික අංග පැහැදිලි කරන්න. (ල.10)

ii. ඕනෑම ජාතික ප්‍රතිපත්තියක් සැලසුම් කිරීමේදී භාවිතා කරන ඉහළ සිට පහළට (Top-Down) සහ පහළ සිට ඉහළට (Bottom-Up Approach) යන ආකෘති පිළිබඳව සාකච්ඡා කරන්න. (ල.15)

03. i. ජාතික තරුණ ප්‍රතිපත්තියේ තරුණ සංවර්ධන කාර්යයන් කෙරෙහි ඇති කෙරෙන බලපෑම පිළිබඳව සාකච්ඡා කරන්න. (ල.12)

ii. ශ්‍රී ලංකාවේ ජාතික තරුණ ප්‍රතිපත්ති සම්පාදනය/සමාලෝචන කාර්යයන් සඳහා සම්බන්ධ විය යුතු රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන ලැයිස්තු ගත කරන්න. (ල.13)

04. ශ්‍රී ලංකාවේ නව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සහ එහි සැකසුම්/ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කරන්න. (ල.25)

05. තරුණ ප්‍රතිපත්තියෙහි ඇති විශේෂ වැදගත්කම, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය සඳහා එහි භූමිකාව පිළිබඳව සාකච්ඡා කරන්න.

(ල.25)

06. 2014 දී තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික තරුණ ප්‍රතිපත්තිය, ඕනෑම ආසියාතික රටක තෝරා ගත් ජාතික තරුණ ප්‍රතිපත්තියක් සමඟ සංසන්දනය කරන්න. (ල.25)

07. පහත සඳහන් කරුණු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i.සුබසාධන ප්‍රතිපත්ති (Welfare Policies) සහ මහජන ප්‍රතිපත්ති (Public Policies) අතර වෙනස පැහැදිලි කරන්න. (ල.15)

ii.සුබසාධනය මත යැපීම (Welfare Dependency) සහ ස්වයංපෝෂිතභාවය. (Self-reliance) (ල.10)

***********සියළුම හිමිකම් ඇවිරිණි***********